# ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය සමඟ එක්වීමට ඔබටත් අනගි අවස්ථාවක්




කොන්ත්‍රාත් පදනම මත රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමට සලකා බැලීම පිණිස (ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ සේවය කර ඇති) පහත සඳහන් සුදුසුකම් ලත් මනා පළපුරුද්දක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අයදුම්පත් කැඳවනු ලැබේ.

# රියදුරු තනතුර

## (කොන්ත්‍රාත් පදනම මත)

## 1. කාර්යය/වගකීම්:

- ජාතික ගමනාගමන රීති, මාර්ග ආරක්ෂණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රවාහන ප්‍රතිපත්තිවලට දැඩි ලෙස අනුකූල වෙමින් සෑම විටම ආරක්ෂාකාරී ව, වගකීම් සහගත ව සහ වෘත්තියමය අයුරින් ශ්‍රී ලංකා මහ බැංකුව සතු වාහන ධාවනය කිරීම.
- ගමන් ආරම්භ කිරීමට පෙර සහ ගමන නිම කිරීමෙන් පසු වාහනයේ තාක්ෂණික තත්ත්වය පරීක්ෂා කිරීම, ඉන්ධන මට්ටම පරීක්ෂා කිරීම, වාහනයේ නඩත්තු කටයුතු (servicing) නියමිත වේලාවට සිදු කිරීම සහ ධාවනයට ලබා දී ඇති වාහනය පිරිසිදු, ධාවනයට සුදුසු සහ මනා තත්ත්වයකින් පවත්වාගෙන යෑම.
- ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, නිල අමුත්තන් සහ බලයලත් රාජකාරී සඳහා සෑම විටම වෘත්තීයමයභාවය සහ ආචාරශීලීත්වය සහතික කරමින් විශ්වසනීය ව සහ නියමිත වේලාවට ප්‍රවාහන සේවා සැපයීම.
- නිවැරදි සහ යාවත්කාලීන ධාවන සටහන් සහ ගමන් වාර්තා පවත්වාගෙන යෑම, කිසියම් මාර්ග අනතුරක්, වාහනයේ දෝෂයක් හෝ නඩත්තු අවශ්‍යතාවක් පිළිබඳ ව අදාල අධීක්ෂකවරයාට හෝ රථ වාහන පරිපාලකවරයාට වහාම දැනුම් දීම.
- විශේෂයෙන් ම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමේ දී සහ රහසිගත තොරතුරු සම්බන්ධ කටයුතුවල දී සෑම විටම ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික ප්‍රතිපත්ති, ආරක්ෂක ක්‍රමවේද සහ රහස්‍යභාවය සම්බන්ධ ප්‍රමිතීන්වලට අනුකූල ව කටයුතු කිරීම.
- අධීක්ෂකවරුන්ගේ උපදෙස් පරිදි පරිපාලන හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා සහාය දක්වමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ ප්‍රවාහන ඒකකයේ සුමට ක්‍රියාකාරීත්වයට දායක වීම.

## 2. අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:

### 2.1 අධ්‍යාපන සුදුසුකම්

අ.පො.ස. (සා.පෙ.) විභාගය එක් වරකදී අවම වශයෙන් විශයයන් පහක් (05) සඳහා සම්මාන සාමාර්ථ සහිතව සමත්ව තිබීම.

### 2.2 පළපුරුද්ද:

රියදුරුවරයකු ලෙස රාජ්‍ය සේවයේ අවම වශයෙන් වසර දහයක (10ක) පළපුරුද්ද,

### 2.3 වයස:

2026.06.14 දිනට වයස අවුරුදු 45ට නොඅඩු සහ අවුරුදු 57ට නොවැඩි විය යුතු ය.

### 2.4 වෙනත් අත්‍යවශ්‍ය සුදුසුකම්:

- නව වාහන පන්තීකරණයට අනුව ‘D’ කාණ්ඩයට අයත් (පෙර වාහන පන්තීකරණයට අනුව ‘A’ කාණ්ඩයට අයත්) වලංගු රියදුරු බලපත්‍රයක් අවම වශයෙන් වසර විස්සක (20) කාලයක් හිමිකරගෙන සිටිය යුතු අතර, එම බලපත්‍රය B, B1, C සහ C1 යන සියලු වාහන කාණ්ඩ ආවරණය කළ යුතුය.; **සහ**
- රියදුරු බලපත්‍රය තහනම් කිරීමකට හෝ අවලංගු කිරීමකට ලක් නොවූ විනීත රියදුරු වාර්තාවක් පැවතීම.; **සහ**
- රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කරන ලද මනා ඇස් පෙනීම සහ ශ්‍රවණ හැකියාව ඇතුළු ව රිය ධාවනය සඳහා ශාරීරික සහ මානසික යෝග්‍යතාව.; **සහ**
- වලංගු පොලිස් නිෂ්කාශන වාර්තාවක්.

## 3. සේවා කාලය:

කොන්ත්‍රාත් පදනම මත වසර තුනකට (03කට) නොවැඩි කාලයක් සඳහා බඳවා ගනු ලැබේ. ආරම්භයේ දී වසරක කාලයක් සඳහා බඳවා ගනු ලබන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාව සහ කාර්යසාධනය මත පදනම් ව සෑම වසරක් අවසානයේදී ම ගිවිසුම දීර්ඝ කෙරෙනු ඇත. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු නොලැබේ.

## 4. වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:

සියලු දීමනා සහිත ව බදුවලට යටත් රු.100,000ක මාසික දීමනාවක්, සහ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ අරමුදල (ETF) සඳහා දායකත්වය.

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

රියදුරු කුසලතා පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මත පදනම් ව සුදුසු අපේක්ෂකයන් තෝරාගනු ලැබේ.

## අයදුම්පත්

අයදුම්පත් https://www.cbsl.gov.lk/en/careers සබැඳිය ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, නියමිත ආකෘතියට අනුකූල ව කටයුතු කරන ලෙසත්, අවශ්‍ය සියලු ම ලියකියවිලි සමග නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.06.14 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන පරිදි පහත ලිපිනයට එවන ලෙසත් දැනුම් දෙනු ලැබේ.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර “රියදුරු තනතුර සඳහා වන අයදුම්පත්‍රය (කොන්ත්‍රාත් පදනම මත)” යනුවෙන් සඳහන් කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් මෙම තනතුර සඳහා සලකා බලනු නොලැබේ. අවශ්‍යතා සපුරා නොමැති හෝ නියමිත දිනට පසුව ලැබෙන හෝ නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කර නොමැති අයදුම්පත්, කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයට පෙර සහතික පරීක්ෂා කරන අවස්ථාවේ දී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්, කිසිදු ආකාරයකින් සුදුසුකම් ලත් අපේක්ෂකයන් ලෙස නොසැලකේ.

තෝරාගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

තනතුරු සඳහා බඳවා ගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. බඳවා ගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා කැඳවනු ලැබේ.

තෝරාගත් සියලු ම අපේක්ෂකයන් සඳහා 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 20 සහ 24 (1) වගන්ති අදාළ වේ.

**අධ්‍යක්ෂ - මානව සම්පත්**
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන : 011-2477330, ෆැක්ස් : 011-2477715